**2025-10-09 බළන්ගොඩ ප්‍රාදේශීය සභා**
**මාසික මහා සභා රැස්වීමේ**
**සංක්ෂිප්ත වාර්තාව**

2025 ඔක්තෝබර් මස 09 වන දින බළන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

**සහභාගිත්වය :**

1. ගරු සභාපති - ගමඇතිගේ ආරියදාස මැතිතුමා
2. ගරු උපසභාපති - බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.බී.ගුණරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.නන්දසිරි මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.සමන් කුමාර මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.ඩබ්.ලක්රුවනි සමරනායක මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.කේ.අජිත් ප්‍රියන්ත මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එම්.ආර්.නයනජිත් හේමාල් මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්.දර්මදාස මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ශ්‍රියානි මැතිනිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.අසෝක්කුමාර් මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩී.ඉඳුනිල් ප්‍රියන්ත මැතිතුමා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.රෝහණ පුෂ්පකුමාර මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ටී.කුසුම්සිරි අලංකාර මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය

**සහභාගි නොවූ -**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමා

**<u>01.පසුගිය සභා වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අපිට න්‍යාය පත්‍රයේ මුලින්ම තියෙන්නේ පසුගිය සභා වාර්තාව සම්මත කිරීම. ගරු මන්ත්‍රීතුමෙක් හෝ තුමියෙක් ඉදිරිපත් වෙලා ඒක සභා සම්මත කරන්න. සංශෝධන තියෙනවනම් ඒවත් ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**

පසුගිය සභා වාරයේදී මම දීර්ඝ වශයෙන් අනඳමෙත්පුර ප්‍රජා ශාලාව ඉදි කරන එකගැන සාකච්ඡා කළා. ඇත්තටම ඒක වැරදි අවබෝධය මත සිද්ධ වෙච්ච දෙයක් මම හිතුවේ ඒ මාතෘකාව කිරිදිගල අනඳමෙත්ගම තියෙන එක ගැන කතා කරනවා කියලා. නමුත් මම පස්සේ තමයි තේරුම් ගත්තේ අනඳමෙත්පුර තියෙන ඉඩම් කොටස ගැන කතා කරලා තියෙන්නේ කියලා. ඒ නිසා මම ඒ කියපු ටික ඉල්ලා අස්කර ගන්නවා. මම ඒ සඳහන් කරපු ටික ඉවත් කරලා පසුගිය වාර්තාව සංශෝධනය කරන්න කියලා ඉල්ලනවා. ඒ සංශෝධන වලට යටත්ව සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සමන් කුමාර මැතිතුමා**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා**

සභාපතිතුමනි, 11 වෙනි පිටුවේ වරිපනම් හා අක්කර බදු වල වට්ටම් ප්‍රසන්ටේජ් එක දානකොට ප්‍රසන්ටේජ් මාර්ක් එක වටිනාකම ඉස්සරහින් දාලා තියෙන්නේ. ඒකත් හදන්න කියලා ඉල්ලනවා.

- ඒ අනුව පසුගිය සභා වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බව මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**02.සභාපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කළ යුතු නිවේදන**

පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කළ යුතු පළාත් පාලන සතිය අපි පැවැත්වුවා පුරා දින 07ක්. අපේ ආරම්භක උත්සවය තිබුණේ ඇල්ලෙවත්ත පන්සලේ. එම ආරම්භක උත්සවයේදී අපි වැඩ රාශියක් කළා. පළාත් පාලන සතියේ අවසාන දිනයේදී අපි ක්‍රීඩා උත්සවය ලෑස්ති කළා. ඒක මං හිතන්නේ ඉතාමත්ම සාර්ථක වුණා. අන්න ඒ සඳහා අපේ මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලාත් අපිට සහයෝගය ලබා දුන්නා. විශේෂයෙන්ම අපේ කාර්ය මණ්ඩලය සෑහෙන්න මහන්සි වුණා මේ කාර්යය සාර්ථක කර ගන්න. ඒ වගේම අපි සමහර අභියෝගවලට පවා මුහුණ දුන්නා. ඉන් එකක් තමයි අපි ගැබිණි මව්වරුන් පනස් දෙනෙකුට පෝෂණ මලුබෙදා දීමේ වැඩසටහනක් ලෑස්ති කරලා තිබුණා. අපි කතාකර ගත්තා මේක සභාවේ පොදු අරමුදල්වලින් නැතුව අනුග්‍රාහකයෙක් හොයා ගෙන අවශ්‍ය කටයුතු සූදානම් කරන්න. එතනදි අපිට අභියෝගයක් ආවා, අනුග්‍රාහය දක්වන්න ඉදිරිපත් වුණු පුද්ගලයා පසුව මේක ප්‍රතික්ෂේප කළා. අපි දන්නේ නැහැ මොන හේතුවක් නිසාද කියලා. අපේ නිළධාරින්ට එයා දැනුම් දීල තිබුණා දේශපාලන අධිකාරිය සම්බන්ධ වෙනවනම් එයා ඒ පරිත්‍යාගය කරන්නේ නැහැ කියලා. ඒ නිළධාරින් ඒක ඇවිත් මට කිව්වා. මං ඊට පස්සේ කිව්වා දේශපාලන අධිකාරිය කියන්නේ මම ඒ නිසා මම නැවිත් ඉන්නම් කියලා. ඊට පස්සේ අපේ නිළධාරින් ඒ පුද්ගලයාට මම කිව්ව කතාව කියලා තිබුණා. ඒත් ඔහු කියලා තිබුණා මම දැන් කොහොමටවත්ම දෙන්නේ නැහැ කියලා. වැඩසටහනට ඉතාම ආසන්නයේදී තමයි ඔහු මේ කතාව කිව්වේ. නමුත් අපේ නිළධාරින් ඉතාම ධෛර්යය සම්පන්නව අවශ්‍ය අරමුදල් එකතු කර ගෙන තිබුණා ඉතාමත්ම කෙටි දින කිපයකින්. මං දැක්කා අපේ මන්ත්‍රීතුමන්ලාත් අනුග්‍රහය දක්වලා තියෙනවා. අන්තිමට අපිට 50 කට දෙන්න සැලසුම් කරලා තිබුණු පෝෂණ මලු 52 කට දෙන්න පුළුවන් වුණා. අන්න එවැනි පුද්ගලයොත් අප සමාජයේ ඉන්නවා කියලා අපි දැන ගත්තොත් හොඳයි. අපට මෙතන දේශපාලනයක් නැහැ. අපි මෙතන දෙපැත්තකට වාඩි වෙලා ඉන්න බව ඇත්ත. නමුත් අපි සියලු දෙනාම මේ කොට්ඨාශ 21 සංවර්ධනය කරන්න , ඒවගේම වත්මන් ආණ්ඩුවේ සංකල්පයක් තියෙනවා පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කියලා, අන්න ඒක යථාර්තයක් බවට පත් කරන්න ,අපි සියළු දෙනාම බැඳී ඉන්නවා පක්ෂ භේදයෙන් තොරව. අන්න ඒ නිසා මෙතන අපි කාටවත් දේශපාලනයක්

නැහැ. ඉතින් අපිට ඒ වැඩසටහන සාර්ථක කරගන්න, පරිත්‍යාගයන් කරපු සියලු දෙනාටම ස්තුති කරන්න මම මේ ගරු සභාව අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම පළාත් පාලන සතියේ අපේ නිළධාරින් ධෛර්යය සම්පන්න ලෙස ඒ කර්තව්‍ය සාර්ථක කර ගන්න කැප වුණා. මේ පළාත් පාලන සතියේ අරමුණ මොකක්ද සභාව සහ ප්‍රජාව ඒකාබද්ධ කිරීම. අවුරුදු ගණනාවකට පස්සේ තමයි මේ පළාත් පාලන සතිය තියන්නේ. සභාව එක පැත්තකයි, ප්‍රජාව තව පැත්තකයි ඉඳලා බැහැ. මේ දෙකම ඒකාබද්ධ කරන්න නම් අපි සහයෝගයෙන් වැඩ කරන්න ඕනි. එකට එකතු වෙලා වැඩ කරන්න ඕනි. ඒ නිසා අපි එවැනි අවස්ථාවන් දැක්කා, එකක් තමයි අපේ සුසාන භූමි එළි පෙහෙළි කිරීම. අපේ ගොඩක් සුසාන භූමිවල අපි බැනර් එකක් දාලා, ප්‍රජාවත් සම්බන්ධ කරගෙන , අපේ මන්ත්‍රීතුමන්ලාත් සම්බන්ධ වෙලා ඒවා එළි පෙහෙළි කළා. ඒ වගේම අපිට තියෙනවා මහා දැවැන්ත කාර්යය භාරයක්. ඒක අපි සියළු දෙනාගේම දෙවුර මත තියෙනවා. ඒ මොකක්ද, මහා මත් උවදුරක් මුළු සමාජයම වෙළා ගෙන තියෙනවා. අපි දන්නේ නැහැ මේ වෙනකොට අපේ දූවා දරුවන් මොකද ඒගොල්ලෝ ටියුෂන් යනවා, ඉස්කෝලේ යනවා, අපි දන්නේ නැහැ මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලාද නැද්ද කියලා. ඒ වගේම දෙමාපියන් සහ දරුවන් අතර තියෙන ඒ අන්‍යෝන්‍ය බැඳීම දැන් අඩු වෙලා තියෙන්නේ. ළමයි එනවා, කාමරයට යනවා අපි දන්නේ නැහැ ඒගොල්ලෝ මත් ද්‍රව්‍ය පාවිච්චි කරලාද නැද්ද කියලා. ඒක නිසා ත්‍රස්තවාදයට වඩා භයානකයි මේ මත් උවදුර. මේ විදියට තව අවුරුදු කීපයක් ගියොත් අර ගම්වල හැළි අරක්කු පෙරන ගානට අයිස් හදයි අපේ ගමවල. පොලිසියට නෙවෙයි, සක්කරයට නෙවෙයි, සක්කරයාගේ පුතා වයිමා ආවත් බැහැ මේක නවත්වන්න. ඒක නිසා අපි සියළු දෙනාටම පැවරිච්ච වගකීමක් තියෙනවා, මේ පළාත් පාලන ආයතනවල , අපේ ප්‍රාදේශීය සභාවල , අපට කොට්ටාශ 21ක් තියෙනවා. ඒ කොට්ඨාශ 21 අපි ඒකට නායකත්වය දෙන්න ඕනි. ඒ නායකත්වය දෙනවා කියලා කියන්නේ, එවැනි මත්ද්‍රව්‍ය අපි තුරන් කරන්න ඕනි. අපි ඇවිල්ලා තියෙන්නේ මේ සමාජය යහපත් කරන්න. ඒක නිසා මෙවැනි මහා භාරදූර්යය කටයුතු වෙනුවෙන් අපි කැප වෙන්න ඕනි. ඒ නිසා මගේ ඉල්ලීම තියෙන්නේ පක්ෂ භේදයෙන් තොරව අපි සියළු දෙනාම එකට එකතු වෙමු. මේ වර්තමාන ආණ්ඩුව ගෙනියන වැඩපිළිවෙල ඉතාම සාධනීයයි. අල්ලස , දූෂණය මුලින්ම නවත්වලා තියෙන්නේ. මහා දැවැන්ත ආදර්ශයක් දීලා තියෙන්නේ. ඒ නිසා අපි සියළු දෙනාම සහයෝගය දෙමු. ඒ වගේම අර පළාත් පාලන සතියේදී ඒකට සහයෝගය දීපු සියළු දෙනාටම ස්තුතිවන්ත වෙනවා.

<u>**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**</u>

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් සහ
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමා අසනීප තත්ත්වයේ

පසුවන බැවින් අද දින සභාවට සම්බන්ධ වෙන්න හැකියාවක් නැහැ කියලා, නිවාඩු ඉල්ලීම් කරපු ලිපි 02ක් සභාගත කරලා තියෙනවා. ඒ අනුව ඔවුන් දෙදෙනාගේ නිවාඩු සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා**</u>

පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් සහ එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලද , නිවාඩු ලබා ගැනීම සම්බන්ධ යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන්ගේ සහ එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමාගේ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

<u>**04.මාසිකව සභාවට ලැබී ඇති ලියුම් ,පෙත්සම්,පැමිණිලි,සංදේශ හා නිවේදන ඉදිරිපත් කිරීම**</u>

ඉදිරිපත් වී නැත

<u>**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**</u> - ඉදිරිපත් වී නැත.

<u>**06. යථා පරිදි කල් දී ඇති යෝජනා**</u>

**06-01 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන දූවිලි ඇල්ල තාවකාලික කඩකාමර ටෙන්ඩර් කිරීම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව මගින් දූවිලි ඇල්ල පරිශ්‍රයේ අලුතින් තාවකාලික කඩ කාමර 15ක් ඉදි කරලා තියෙනවා. දැන් ඒකේ වැඩ කටයුතු අවසන් වෙලා තියෙන හින්දා 2026 වර්ෂයට විවෘත ටෙන්ඩර් කැඳවීමක් කරලා බදු දෙන්න ඕනි. අපි මේ කඩ කාමර බදු දෙන්නේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභ පනතේ 19 (1) 11 සහ 12 වගන්ති අනුව වගේම, පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2023/01 කියන චක්‍රලේඛයට අනුව.ඒ වගේම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අපිට තක්සේරු වාර්තාවක් එවලා තියෙනවා. ඒකේ මේ එක් කඩ කාමරයක තක්සේරු වටිනාකම විදියට දක්වලා තියෙන්නේ මසකට රු.500.00ක මුදලක්. නමුත් අපි දැන් සතියකට රු.250.00 බැගින් වෙන විදියට මසකට රු.1000.00 මුදලක් තාවකාලික කාඩකාමර හිමියන්ගෙන් අය කරගන්නවා. දැන් තියෙන වෙළඳපල වටිනාකම එක්ක මේ රු.500.00 කියන මුදල ප්‍රමාණවත් වෙන එකක් නැහැ කියලයි මම හිතන්නේ. ඒ අනුව අපි 2026 වර්ෂයට මෙම කඩ කාමර කොපමණ මුදලකට ටෙන්ඩර් කරනවාද සහ ගිවිසුම්ගත කරුණු වල මොනවහරි වෙනසක් වෙන්න ඕනිද කියලා තීරණය කරන්න ඕනි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**

සභාපතිතුමා, දීර්සකාලීනව සභාවට ආදායම් ලබා දීපු කඩ කාමර ටිකක් තමයි ඔතන තිබුණේ. මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීතුමන්ලා කට්ටියම කතා කරලා ගාණක් තීරණය කරමු. ඒ වගේම මම අදහස් කරනවා, මේ හිටපු කට්ටියටත් විවෘත ටෙන්ඩර් මාර්ගයෙන් අවස්ථාව සැළසුවොත් හොඳයි කියලා. අපිට තව අලුත් අයට අවස්ථාව දෙන්නත් පුළුවන්. ඒ වගේම දූවිලි ඇල්ල දැන් පෙරට වඩා දියුණු මට්ටමක තියෙන නිසා මිල පොඩ්ඩක් වැඩි කළොත් හොඳයි කියලා හිතෙනවා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

දූවිලි ඇල්ල සංවර්ධනය කරන කොට අර පහළ තියෙන පාර්ක් එකට ලයිට් නැහැ. අපි දැන් ලයිට් ගන්න ඉන්නේ. ඒ වගේම නාන ස්ථානයක් එතන නැහැනේ. දැන් මිනිස්සු ගොඩක් අය එන්නේ නාන්න බලාගෙන. ඒ නිසා අපි ඉන්නේ අර අතන හරස් පාරක් තියෙනවානේ. අන්න එතන 500ට වගේ ආරක්ෂිතව නාන්න පුළුවන් තැනක්. එතන ස්විමින් පූල් එකක් වගේ හැදිලා තියෙන්නේ. එතන පාරත් හදන්න තියෙනවා. ඊට පස්සේ එතන අයිනේ සුදුසු තැනක වොෂ් රූම් හදලා ඒ වගේ වැඩ ටිකකුත් තියෙනවා. ඒ නිසා මේ විදියට සංවර්ධනය කළොත් අපිට සංචාරක ආකර්ෂණය වැඩි කරගන්නත් පුළුවන්. සංචාරක ආකර්ෂණය වැඩි කර ගන්න වැඩසටහන් ටිකකුත් තියෙනවා. ඒ නිසා අපි ඒවා සියල්ල සැළකිල්ලට අරගෙන මේ ගරු සභාව අවම ලංසු මුදල තීරණය කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බී.ගුණරත්න මැතිතුමා</u>**

සභාපතිතුමනි, මං පොඩි අදහසක් ඉදිරිපත් කරනවා මේකේදී කරුණු කීපයක් පිළිබඳව අවධානය යොමු කරන්න. දැනට අපි කඩ කාමර කීපයකින් සතියකට රු.250.00 ගානේ තමයි අය කරලා තියෙන්නේ. මෙතනදි කඩ කාමර 15ට වගේ විශාල ප්‍රමාණයකට යනවා. ඒ වගේම අවධානය යොමු කරන්න ඕනි දැන් මේ ඉන්න සංචාරකයෝ ප්‍රමාණයත් එක්ක නම් රු.500.00 මුදලට වඩා එහාට නම් යන්න බැරි වෙයි මං හිතන්නේ. ඉතින් අපි දැඩි උත්සාහයක් කරන්න වෙනවා සංචාරකයින් ප්‍රමාණය වර්ධනය කරගන්න. ඒකත් එක්ක සළකා බලලා තමයි අවම ලංසුව වැඩි කරනවනම් වැඩි කරන්න තියෙන්නේ. එහෙම කරනවනම් මගේ අදහස වන්නේ මසකට රු.1000.00 මුදල සුදුසුයි කියලා.

**<u>ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, ගුණරත්න මන්ත්‍රීතුමා කිව්වා වගේම බලපාන පොඩි කාරණයක් තියෙනවා. දැනට මහා ලොකු ආදායමක් එන්නේ නැහැ.යම් පිරිසක්නේ ඉන්නේ. දැන් කඩ ප්‍රමාණයත් ඔතන වැඩි වෙනවා. එතකොට බිස්නස් එකත් ඔය කඩ ටිකට කැඩිලා යනවා. එතකොට ඔය ආදායමත් එක්ක මං

හිතන්නේ නැහැ එගොල්ලන්ගෙන් ලොකු මුදලක් අයකර ගන්න පුළුවන් වෙයි කියලා. දැනට විශේෂ දවස් වලට විතරයි ආදායම වැඩි වෙන්නේ. එතකොට සභාව සාධාරණ තීරණයකට එන්න වෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඑම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා</u>**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි, ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීතුමියනි, මාධ්‍යවේදී මහතුන් ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. සභාපතිතුමනි, ඔතන සංචාරකයින් විදියට ගත්තම දූවිලි ඇල්ලට වැඩිපුරම එන්නේ දේශීය සංචාරකයන්. කූරගල ප්‍රදේශයට සංචාරකයන් විශාල වශයෙන් සැළකිය යුතු පිරිසක් එනවා. එතකොට එතන තමයි ඔය කල්තොට පැත්ත ගත්තම සෙන්ටර් පොයින්ට් එක විදියට තියෙන්නේ. එතකොට එතනට එන අය දැනුවත් වීමක් නැහැ මේ වගේ මනස්කාන්ත දිය ඇල්ලක් ඔතන තියෙනවා කියන්න. මම මීට වසර කීපයකට කලින් පුරා විද්‍යාව ඉගෙන ගත්තා. ඒ කාලේදී මම දැකපු දෙයක් තමයි යම් කිසි ප්‍රදේශයක ජනතාව ගැවසෙන ස්ථානයේ කණ්ඩායමක් ඉන්නවා ඒ අවට තියෙන සංචාරය කළ යුතු තැන් නිරීක්ෂණය කරන්න දැනුවත් කරන්න. අපට පුළුවන් නම් කූරගල පුරවරයට එන සංචාරකයන් දැනුවත් කරන්න ඔය හුණුගල් පොකුණ, දූවිලි ඇල්ල වගේ තවත් තැන් තියෙනවා කියලා, ඒවත් නරඹන්න යන්න කියලා කූරගලදි , එහෙම නැත්තම් එතන දැන්වීම් පුවරු ටිකක් සවි කරන්න පුළුවන් නම් මං හිතනවා ඒ එන පිරිසෙන් සැළකිය යුතු ප්‍රමාණයක් දූවිලි ඇල්ල නරඹන්න යයි කියලා. එතකොට එහෙම වුණොත් අපිට ලබා ගන්න පුළුවන් ආදායම වැඩි වෙයි කියලා මම විශ්වාස කරනවා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

හරි අපි එහෙනම් පොදු ගාණ විදියට කතා කරපු රු.1000.00ට යමු නේද.

- ඒ අනුව දූවිලි ඇල්ල තාවකාලික කඩ කාමර 15, මසකට රු.1000.00 ක් වන අවම ලංසු මුදල යටතේ, අදාළ කොන්දේසි වලට යටත්ව ටෙන්ඩර් කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-02 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වේළිඔය සෙනසුරාදා සතිපොළ 2026 වර්ෂයට බදු දීම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

වේළිඔය සෙනසුරාදා සතිපොළ 2026 වර්ෂයට ටෙන්ඩර් කැඳවලා බදු දෙන්න ඕනි. අපි 2025 වර්ෂයේදී රු.700,750.00 මුදලට ටෙන්ඩර් කැඳවලා තියෙනවා. ඊට පස්සේ වැඩිම ලංසු මුදල වුණු රු.700,800.00 මුදලට තමයි බදු දීලා තියෙන්නේ. ඒ අනුව අපි ලබන වසර ඒ කියන්නේ 2026 වර්ෂය සඳහා බදු දෙන අවම ලංසු මුදල කොපමණ කියලා තීරණය කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, වේළිඔය සතිපොළ මං හිතන්නේ පසුගිය වර්ෂයට සාපේක්ෂව වඩා වැඩිපුර වෙළදාම් කිරීම සඳහා කීප දෙනෙක් ඉදිරිපත් වෙලා තියෙනවා. ඒක නිසා මගේ ඉල්ලීම දැනට තියෙන රු.700,800.00 මුදල තව පොඩි ප්‍රමාණයකින් හෝ වැඩි කර ගත්තොත් හොඳයි කියලා. ඒ වගේම පොළ භූමිය තුළ සංවර්ධන කටයුතුත් කීපයක්ම කිරීමට තිබෙනවා. පසුගිය 25 වන දින ඔබතුමා සහ නිළධාරින් ඒ වගේම පොළේ වෙළදාම් කරන වෙළඳ මහතුන් සම්බන්ධ කරගෙන අපි සාකච්ඡාවකුත් කළා. එහිදී යම් යම් තීන්දු තීරණවලටත් එළඹුණා. ඒ අනුව මං හිතන්නේ පොළභූමිය දැනට තිබෙන විදිය ඉතාමත් අක්‍රමවත් නිසා ක්‍රමවත්ව පවත්වා ගෙන යාම සඳහා අපි යම් තීන්දු තීරණ වගයක් අර ගත්තා. ඒ අනුව පසුගිය සතියේ සෙනසුරාදා වෙනකොට පොළ යම්තාක් දුරට ක්‍රමවත්ව ක්‍රියාත්මක වුණා. එහිදී මං හිතන්නේ පොළ භූමියේ ඉදිරිපස කොටසේ වෙළඳමහතුන් ක්‍රමානුකූලව වෙළදාම් නොකිරීම නිසා පොළ භූමිය ඇතුළට මිනිසුන්ට යාමට නොහැකි තත්ත්වයක් තිබුණා. නමුත් අපි

සාකච්ඡා කරගත් පරිදි ගිය සතියේ සිට ක්‍රමවත්ව කිරීමට කල්තොට පොලිසියේ ස්ථානාධිපතිතුමා, ඒ වගේම ප්‍රාදේශීය සභාවේ අදාළ නිළධාරින් සියලු දෙනා එකතු වෙලා එය ක්‍රියාත්මක කළා. ඒ වෙනුවෙන් මගේ ගෞරවනීය ස්තුතිය මේ සභාව වෙනුවෙන් පුදකර සිටිනවා. ඒ වගේම මෙම කාර්යය සිදු කිරීමේදී යම් කිසි ගැටළුකාරී තත්ත්වයකුත් උදා වුණා. නමුත් එය අපි යම්තාක් දුරකට සමථයකට පත් කර ගත්තා. ඒ වගේම මම ඉල්ලීමකුත් කරනවා මේ අවස්ථාවේදී යම් යම් සිදුවීම් සිදු වුණා ඒ අදාළ වෙළඳමහතුන් අතර ගැටළුකාරී තත්ත්වයක් ඇති කිරීමට මං හිතන්නේ ප්‍රදේශයේ කිහිප දෙනෙකුම පෙළඹී තිබුණා. ඒ තත්ත්වය සමථයකට පත්කරගෙන ඉදිරියේදී මෙම පොළ භූමිය සාර්ථකව පවත්වා ගෙන යන්න කටයුතු කරමු කියලා ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

මේ සතියේත් අපේ නිළධාරින් කිහිප දෙනෙක් සම්බන්ධ වෙනවා පොළට. ඇත්තටම ගත්තාම මේ සභාවෙන් පාලනය වෙන පොළක්. කිසිම පිළිවෙළක් නැහැ. කඩ කාමර හිස්ව තියෙනවා. පාරේ වෙළදාම් කරනවා. සමහර කඩ වැහෙනවා. ඊට පස්සේ අපි පොලීසියත් එක්කගෙන තමයි එතනට ගියේ. ගිහිල්ලා ඉවරවෙලා ජගත් මන්ත්‍රීතුමා කිව්ව විදියටම කිසිඳු පිළිවෙලක් නැහැ. හරිම අක්‍රමවත්. අපි සාමාන්‍යයෙන් දන්න දෙයක් තමයි අපිළිවෙළට තියෙන දෙයක් පිළිවෙලට කරන්න යනකොට කොහොමත් ගැටළු ඇති වෙනවා. ඒක බලන් ඉන්න බැරි අයත් ඉන්නවා. අරවට යටින් උල් පන්දම් දෙන අයත් ඉන්නවා. ඒක නිසා අපි මෙහෙම කරමු. අපේ නිළධාරිනුත් මැදිහත් වෙලා මේක පිළිවෙලකට හදමු. අපි හැමෝම මැදිහත් වෙමු මේක විධිමත්ව හදන්න. එකක් තමයි ටොයිලට් පහසුකම් සම්පූර්ණ අවුල් වෙලා තියෙන්නේ. ඊට පස්සේ දැන් අපි අද වෙනකොට අපේ JCB එක දාලා ග්‍රෙවල් කරන්නවා ABC දාන්න. නැත්තම් මහ වැස්සට මඩ වෙනවා. හරි එහෙනම් දැන් අපි අපේ අවම ලංසු මුදල තීරණය කරමු. දැන් තියෙන්නේ රු. 700,800.00 යි.

<u>**ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා**</u>

මං හිතන විදියට දැනට පොළ කරන අය කියන්නේ පොළෙන් පාඩුයි කියලා තමයි. ඒ නිසා අපි පොඩ්ඩක් හොයන්න බලන්නත් වෙනවා මේ කාරණාව ගැන අපි ලොකු මුදලකට ගියොත් පොළටත් ලොකු ගැටළුවක් එනවනේ. ඒ නිසා අපි ලොකුවට වෙනසක් නොකර දැනට මේ තියෙන රු.700,800.00 මුදලම අවම ලංසු මුදල විදියට පවත්වා ගෙන යමු.

- ඒ අනුව වේළිඔය සෙනසුරාදා සතිපොළ 2026 වර්ෂයට බදු දීමේදී, අදාළ කොන්දේසි වලට යටත්ව, අවම ලංසු මුදල ලෙස තීරණය කරන ලද රු.700,800.00 මුදලට ටෙන්ඩර් කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### 06-03 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වේළිඔය බහුකාර්ය ගොඩනැගිල්ලේ පහත මාලයෙහි අලුතින් ඉදි කරන ලද කඩ කාමර 08 දිගු කාලීනව බදු දීම සම්බන්ධ යෝජනාව

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

අපේ සභාව සතුව පවතින වේළිඔය බහුකාර්ය ගොඩනැගිල්ලේ පහත මාලයේ තියෙනවා අලුතින් ඉදි කරන ලද කඩ කාමර 08ක්. එතකොට මෙම කඩ කාමර 08 , පළාත් පාලන කොමසාරිස්ගේ 01/2023 චක්‍රලේඛය අනුව , දිගු කාලීනව බදු දෙන්න අවශ්‍ය අනුමැතිය ගන්න ඉල්ලීමක් කරලා 2024-12-30 දිනෙන් ලිපියක් යොමු කරලා තියෙනවා ආණ්ඩුකාරතුමියට. එතකොට මේ අනුමැතිය ගන්න යොමු කරලා තියෙන්නේ, කොමසාරිස් පාලනය තිබුණු කාලේ තීරණ කමිටුව මගින් ගත් ලේකම් තීරණයත් එක්ක. නමුත් මේ වන විට සභාවක් පත් වෙලා ඇවිල්ලා තියෙන නිසා පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මගින් දැනුම්දීලා තියෙනවා සභාවේ අනුමැතිය අරගෙන ඒකේ වාර්තාවක් එවන්න කියලා. මේ වනවිට අපි එහෙට යවලා තියෙන ලියකියවිලි වල කිසිම අඩුපාඩුවක් නැති නිසා සභා වාර්තාවේ

පිටපතක් එහෙට යොමු කළහම අපිට ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගන්න පුළුවන්. ඒ අනුව මෙම කඩ කාමර 08 වසර 30ක කාලයකට දිගු කාලීනව බදු දෙන්න, ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යොමු කරන්න ඕනි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා</u>**
සභාපතිතුමා, ඔතන දිගු කාලීනව කියලා අදහස් කරන කාලය කොච්චරක්ද කියලා දැන ගන්න පුළුවන්ද.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
අපි මෙතන දිගු කාලීනව කියන්නේ අවුරුදු 03ට වඩා වැඩි සහ අවුරුදු 30 හෝ 30ට අඩු කාලයක්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා</u>**
සභාපතිතුමනි, මං හිතනවා අවුරුදු 30ක් තියන්නේ ලොකු කාලයක් නිසා අවුරුදු 05ට වගේ යන්න පුළුවන් නම් හොඳයි කියලා. සභාවේ අනිත් අයගෙත් අදහස් විමසලා සුදුසු තීරණයක් ගමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා</u>**
ගරු සභාපතිතුමනි, අපේ දර්මදාස මන්තීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ඒ කියන්නේ වසර 05ක් වගේ කාලකයකට ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා මං හිතනවා. මොකද සමහරවිට ගත්ත කෙනා අවරුදු 30 ඉවර වෙනකොට ජීවතුන් අතර ඉදියිද කියලා කියන්නත් බැහැ. ඒ නිසා අවුරුදු 05 හොඳයි කියලා මං හිතනවා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
අපි දැන් මේක අනුමැතියට යවලා තියෙන්නේ අවුරුදු 30 ට දිගු කාලීනව බදු දෙන්න. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අපිට මාසික වෙළඳපල කුලිය තක්සේරු කරලා එවලා තියෙනවා. ඒ වගේම මේ තක්සේරු මුදල අවුරුදු 03න් 03ට වෙනස් වෙනවා. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කරන්නේ ඉදිරි අවුරුදු 03 ක කාලයකට බලපැවැත්වෙන විදියට. අපි දිගු කාලීනව බදු දෙනකොට ඒ ගොල්ලන්ගෙන් කී මනි විදියට එකවර ලොකු ගාණක් අය කර ගෙන තමයි දිගු කාලයකට ලබා දෙන්නේ.

**<u>ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා</u>**
සභාපතිතුමනි, මගේ අදහසත් වසර 05කට වගේ කාලයකට යන්න පුළුවන් නම් හොඳයි කියලා. මොකද අවරුදු 30ක් කියන්නේ ලොකු කාලයක්. එතකොට දීර්ඝකාලීනව ලොකු ගැටළු රාශියකට මුහුණ දෙන්න වෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බී.ගුණරත්න මැතිතුමා</u>**
ගරු සභාපතිතුමනි, මේ අවුරුදු 05ක කාල සීමාව කියන එක ගැන යම්කිසි ගැටළුවක් මතු වෙනවා මගේ අදහසේ හැටියට. මොකද කෙනෙක් කඩ කාමරයක් අරගෙන ව්‍යාපාරයක් ආරම්භ කරන්න පටන් ගන්නකොටම ඒ ව්‍යාපාරය අවුරුදු 05න් ඉවත් කර ගන්න සිද්ධ වුණොත් එයා කඩ කාමරයක් ගන්නම කැමැති වෙයිද කියලා පොඩි ගැටළුවක් මතු වෙනවා. ඒ නිසා මේ පිළිබඳවත් ඔබේ අවධානය යොමු කරනවනම් සුදුසුයි කියලා මං හිතනවා. ඒ නිසා 05 සීමාව සුදුසුද කියලා පොඩ්ඩක් හිතලා බලන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**
සභාපතිතුමනි, සභාව නොතිබුණ කාලේ ඒ තීරණත් එක්ක ගත්ත මිල ගණන් අපිට දැන ගන්න පුළුවන් නම් හොඳයි. ඒ වගේම වෙළිඹය කඩ කාමර 08 සභාව තිබුණු අවසන් වර්ෂයේ ඒ කියන්නේ 2023 හෝ 2022 වසරේ අපි ටෙන්ඩර් කළා. එතකොට ගුණරත්න මන්ත්‍රීතුමත් හිටියා. අපි ඒ තිබුණු මිල ගණන් ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. අපි මෙතනට ටෙන්ඩර් කමිටුව ගෙන්නුවා. එතුමන්ලා ගෙනුත් විස්තර ගත්තා. එහෙම විස්තර අරන් තමයි තීරණයකට ආවේ. ඒ වගේම ගුණරත්න

මන්ත්‍රීතුමා කිව්වා වගේම වසර 05න් වසර 02ක් විතරම යනවා වෙළඳාම හදා ගන්න. ඊට පස්සේ අනිත් පහසුකම් ඔක්කොම හදා ගෙන ඉවර වෙනකොට වසර 05ක් විතර වෙලා, වසර 05 අවසානයේ දීලා යන්න වුණොත් එහෙම ඒක ලොකු ගැටළුවක්. ඒ වගේම අපි බලාපොරොත්තු වෙන ගාණට කඩ හිමියෝ ගන්නවනම් අපිට ගැටළුවක් නැහැ. අනිත් එක අපේ නීති කඩ කරනවනම් අපිට පුළුවන් ඒ ගොල්ලන්ගෙන් ආපහු කඩ කාමරය ගන්න සභාවට දාලා අනුමැතියක් අරගෙන. අනික දීර්ඝ කාලීනව බදු දෙනකොට අපිට ඒ ආදායම ස්ථිරයි. අනිවාර්යයයෙන් අපි අවුරුදු 20ට හරි 30ට හරි ඇස්තමේන්තු කරලනේ දෙන්නේ. එතකොට අපි දන්නවා අනිවාර්යයයෙන්ම ඒ ගාණ සභාවට හම්බ වෙනවා කියලා. ඒක අවුරුදු 30 දී නෙමෙයිනේ මුලින්ම දෙනකොටනේ හම්බ වෙන්නේ. එතකොට ලොකු ගාණක් අපේ බජට් එකේ එකතු වෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා</u>
සභාපතිතුමනි, සාමාන්‍යයෙන් ව්‍යාපාරයක් හොඳ තත්ත්වයකට එන්නම අවුරුදු 05ක් විතර යනවා. ඒ නිසා දෙනවනම් අඩුම තරමේ අවුරුදු 20ටවත් දෙන්න ඕනි. අපි හිතමු ප්ලාස්ටික් බඩුවක් හරි ඇලුමිනියම් බඩුවක් හරි කොළඹින් ගෙනාවා කියලා. දැන් ඔය ටික ඔක්කොම ගෙනල්ලා එයා ව්‍යාපාරය කරන්න ලෑස්ති වෙනකොටම අවුරුදු 05 ඉවරයි. එයා ආපහු දෙන්න ඕනි වෙන කාට හරි. දෙනවනම් 20ක් වත් දෙන්න ඕනි අඩුම. සාමාන්‍යයෙන් බිස්නස් එක හදාගන්නම අවුරුද්දක් යනවා. යම් මට්ටමකට එනකොට එයා වෙන කෙනෙකුට බිස්නස් එක දීලා යනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනිය</u>
ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් ව්‍යාපාරයක් ආරම්භ කළහම ව්‍යාපාරයටත් තියෙනවනේ ළදරු කාලයක්. ව්‍යාපාරයක් බොහෝ දුරට පටන් ගන්නේ එක්කෝ බැංකු ණයක් අරගෙන, නැත්තම් ප්‍රාග්ධනය සපයා ගන්න විවිධ ක්‍රම තියෙනවා. ඒ හරහා මේ ව්‍යාපාරයක් ආරම්භ කරලා පවත්වගෙන යන කොට අවුරුදු 05ක් නෙමෙයි අවුරුදු 10ක් වත් අඩුම යන්න පුළුවන්. ඒ නිසා අපි ප්‍රාදේශීය සභාවක් විදියට, පළාත් පාලන ආයතනයක් විදියට, අපේ අරමුණ වෙන්නේ අපේ ප්‍රදේශයේ ඉන්න ජනතාවට සුභ සිද්ධිය ලබා දෙන එක. ඒ නිසා ව්‍යාපාරයක් ගොඩනැගෙනවා කියන්නේම අපේ ප්‍රදේශයේ ජනතාවට ආදායම් මාර්ගයක් වගේම නව රැකියා අවස්ථාවන්ද ගොඩනැගෙනවා. ඉතින් අපි පළාත් පාලන ආයතනයක් විදියට අපිට හැකි ආකාරයට ව්‍යවසායන් ගොඩනාගන්න අපේ සහයෝගය ලබා දෙන්න ඕනි. ඉතින් මම යෝජනා කරන දෙයක් තියෙනවා අවුරුදු 30ක සීමාවකට අපේ සභාවට ගැළපෙන නීති රීති එකතු කරමින්, අවුරුදු 03න් 03ට ආගණනය කරමින්, ඒ විදියට ගිවිසුම් ගත වෙන එක හොඳයි. නැත්තම් අවුරුදු 05න් 05ට යනකොට අපි කලින් ටෙන්ඩර් කරද්දිත් අපිට ඔය ගැටළුව ආවා. එයාලා නව අංගඋපාංග එකතු කරමින් ව්‍යාපාරය ආකර්ශනය කර ගන්න සහ ව්‍යාපාරය ගොඩනගා ගන්න විවිධ දේවල් කරනවා. අවුරුදු 05ට වගේ යනකොට ඒවා ගොඩනාගා ගත්ත ගමන්ම ඉවත් කරන්න සිද්ධ වෙනවා. ඉතින් ඒ ප්‍රශ්නත් එක්ක එයාලට ස්ථාවර ව්‍යාපාර පසුබිමක් හදා ගන්න වඩාත් සුදුසුයි අවුරුදු 30ක ගිවිසුම් කාලසීමාවට යටත්ව , අවුරුදු 03න් 03ට ආගණනය කරමින්ලබා දීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>
මේ විදියට සීමාවක් අවුරුදු 30ට වගේ දාලා ඇත්තේම ඔය කියන කරුණු සළකා බලලා වෙන්න ඇති. එහෙනම් අවුරුදු 30ට දිගු කාලීනව බදු දීමේ තීරණයකට යමු නේද.

- ඒ අනුව වේළිඔය බහුකාර්ය ගොඩනැගිල්ලේ, පහත මාලයෙහි අලුතින් ඉදි කරන ලද කඩ කාමර 08, වසර 30ක කාලයකට දිගු කාලීනව බදු දීම වෙනුවෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා, ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යැවීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-04 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ගබඩාව සතු යකඩ බට සම්බන්ධ යෝජනාව**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මේ යෝජනාව ගැන කතා කරනකොට බඩු වට්ටෝරු පොත් අංක 1/33/37 හි බට 275ක් සහ 1/33/39 හි බට 147ක් වන විදියට මුළු බට 418 ශේෂ වෙලා තියෙනවා. 2024-12-31 දිනට සිදු කරපු භාණ්ඩ සමීක්ෂණයේදී මෙම බට භෞතිකව පරීක්ෂා කරන කොට අඩි 18.5, අඩි 16 සහ අඩි 14ක් වන දිගැති බට වගේම අඩි 1.5 , අඩි 3සහ අඩි 4 වෙන විදියට කුඩා බට කැබලිත් තිබිලා තියෙනවා. එතකොට බඩු වට්ටෝරු පොතේ අඩි 12ට වැඩි බට සම්පූර්ණ බට විදියට තමයි තුලනය කරලා තියෙන්නේ. කුඩා බට කැබලි අඩි 18ක් වෙන විදියට ගැලපීම් කරලා තමයි බඩු වට්ටෝරු පොතේ ශේෂයත් එක්ක සන්සන්දනය කරලා තියෙන්නේ. එතකොට අපි දැන් 2025-12-31 දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු ආරම්භ කරන නිසා, මේ බට ටික ආපසු පාරක් මනින එක සුදුසුයි කියලා විෂය නිළධාරිතුමා කියනවා. ඒ වගේම පෙර වර්ෂයේ කරපු භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න කියලත් අනුමැතිය ලැබිලා තියෙනවා. ඒ නිසා මේ ටික නැවත වරක් මැනලා ඉදිරි සමීක්ෂයේදී ප්‍රයෝජනයට ගන්න පුළුවන් බට ටික බඩු වට්ටෝරු පොතේ නව තීරුවකට ඇතුළත් කරලා නිවැරදි කරන්නයි, ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමේ තියෙන බට වෙන්දේසි කරන්නයි ඕනි.

- ඒ අනුව ගබඩාව සතුව ප්‍රයෝජනයට ගතහැකි මට්ටමේ පවත්නා යකඩ බට, බඩු වට්ටෝරු පොතේ නව තීරුවකට ඇතුළත් කොට නිවැරදි කිරීමටත්, ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමේ පවත්නා බට වෙන්දේසි කිරීමටත්, අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකතමතිකව තීරණය කරන ලදී.

**06-05 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ගබඩාව සතු උත්සව භාණ්ඩ සුභ සාධන කටයුතු සඳහා ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ද මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

දැන් අපේ සභාව සතුව පවතිනවනේ උත්සව භාණ්ඩ. ඒවා අපේ කාර්යමණ්ඩලයට සහ සභිකවරුන්ට ලබා දීමට අදාළව තමයි මේ යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ. එතකොට අපේ සභාව සතුව පවතින උත්සව භාණ්ඩ ටික මම ඉදිරිපත් කරන්නම්.

- ✓ ප්ලාස්ටික් පුටු 200
- ✓ ටකරන් 08
- ✓ කිලෝ ග්‍රෑම් 25න් සාස්පාන් 02
- ✓ ලොකු තාච්චි 01

මෙන්න මේ කියන උත්සව භාණ්ඩ ටික අපේ කාර්ය මණ්ඩලයේ හරි සභිකවරයෙකුගේ හෝ සභිකවරියකගේ හරි නිවසක හදිසි අවශ්‍යතාවයක් වුණාම ඒ කියන්නේ, මළ ගෙයක් මඟුල් ගෙයක් හරි දානමය කටයුත්තක් වැනි අවස්ථාවකදී ලබා දෙන්න සිදු වෙනවා. අපිට මේකට කොන්දේසි ටිකකුත් දාලා තියෙනවා ඒකත් මම කියන්නම්.

- ✓ නිළධාරියාගේ / සභිකයාගේ පවුලේ සාමාජිකයෙකු වීම (කලත්‍රයා/දරුවන්)
- ✓ නිළධාරියාගේ / සභිකයාගේ නිවසේ පදිංචිව සිටින අවිවාහක සහෝදරයෙක් වීම
- ✓ නිළධාරියාගේ / සභිකයාගේ මව,පියා, නැන්දම්මා සහ මාමා

මෙන්න මේ කියන කට්ටියට විතරයි හැබැයි දෙන්න පුළුවන්. මේ වගේ කොන්දේසි දාලා තියෙන්නේම නැත්තම් ගැටළුව මතු වෙන්න පුළුවන්. දැන් අපේ ගමේ මරණාධාර සමිතියක් ගත්තත් මේ වගේ කොන්දේසි දාලා තියෙනවනේ. නැත්තම් ඉතින් කරන්න අමාරු වෙනවා ඒකයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය</u>**

සභාපතිතුමනි, පොදු කටයුතු සඳහාත් මෙම භාණ්ඩ වගකීමක් ඇතුව ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා මම අදහස් කරනවා.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
මන්ත්‍රීතුමිය, අපි ඒකත් යෝජනාවක් විදියට න්‍යාය පත්‍රයට දාලා තියෙනවා. ඊළඟට තියෙන්නේ ඒ යෝජනාව තමයි.

- ඒ අනුව සභාව සතුව පවතින උත්සව භාණ්ඩ අදාළ කොන්දේසිවලට යටත්ව, කාර්ය මණ්ඩලයටත්, සභිකවරුන්ටත් නොමිලේ ලබා දීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06-06 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ගබඩාව සතු උත්සව භාණ්ඩ රජයේ සහ පුණ්‍ය ආයතන සඳහා නිකුත් කිරීම සම්බන්ධ යෝජනාව

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බී.ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
දැන් අපි නීති වැඩමුළුවලට ගියහම කියනවා අපිට කිසිම දෙයක් නිකන් දෙන්න එපා මුදල් අය කරලා දෙන්න කියලා. මොකද මේවා නඩත්තු වෙන ආයතන තියෙනවා කියලා. නමුත් අපේ සභාවන්වලින් මෙච්චර කාලයක් පන්සල් වලට එතකොට රජයේ ආයතන වලට මේ උත්සව භාණ්ඩ නොමිලේ ලබා දීලා දැන් දෙන්න බෑ කිව්වහම ටිකක් හොඳ මදි. මොකද මිනිස්සු දන්නේ නැහැනේ මේවායේ තියෙන සීමාවන්. ඒ නිසා මෙන්න මේ කියන සීමාවන් ඇතුළේ ඉඳගෙන අපේ සභා බලප්‍රදේශයේ තියෙන රජයේ ආයතන සහ පුණ්‍ය ආයතනවලට විතරක් අපි නොමිලේ ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා තීරණය කළා. එතකොට මේක ක්‍රියාත්මක වෙන්නේ අපේ බලප්‍රදේශයේ ස්ථානවලට පමණක්මයි. මම ආයතන ටික කියන්නම් අපි දෙන්න බලාපොරොත්තු වෙන.

- ✓ බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- ✓ කල්තොට ප්‍රදේශීය ලේකම් කාර්යාලය
- ✓ ශ්‍රී ලංකා පොලීසිය - කල්තොට
- ✓ ශ්‍රී ලංකා පොලීසිය - බළන්ගොඩ
- ✓ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය - බළන්ගොඩ
- ✓ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය -කල්තොට
- ✓ ගමනා ගමන මණ්ඩලය - බළන්ගොඩ
- ✓ කලාප අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ
- ✓ සභා බල ප්‍රදේශයේ පාසල්
- ✓ සභා බල ප්‍රදේශයේ පුණ්‍ය ආයතන

එතකොට ඔන්න ඔය කියන ආයතන වලින් උත්සව භාණ්ඩ ඉල්ලුම් කළොත්, ඒවා නොමිලේ අපිට දෙන්න සිද්ධ වෙනවා.

- ඒ අනුව සභාව සතු උත්සව භාණ්ඩ අදාළ කොන්දේසි වලට යටත්ව සභා බල ප්‍රදේශය තුළ පවත්නා රජයේ ආයතන සහ පුණ්‍ය ආයතනවලට නොමිලේ ලබා දීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06-07 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන පිඹුරුපත් අනුමත කිරීම සඳහා අවසර ලබා ගැනීම සම්බන්ධ යෝජනාව

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

බළන්ගොඩ පෙට්ටිගල වත්ත ජන උදා ගම්මානයෙහි පදිංචි නිමල් ප්‍රේමසිරි මහතා විසින් පිඹුරුපත් අනුමත කරන්න ඉදිරිපත් කරලා තියෙනවා සැලසුම් කමිටුවට. එතකොට සැලසුම් කමිටුවෙන් මේකේ පර්චස් 07න් යුක්ත ඉඩම් කොටස් 42ට අනුමැතිය ලබා දීලා තියෙනවා..

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**
සභාපතිතුමා අපිට ඔය කාරණාව පැහැදිලි මදි. සවිස්තරාත්මකව පොඩ්ඩක් විස්තර කරන්න පුළුවන් නම් හොඳයි. මොකද විස්තරය හරියටම දන්නේ නැතිව අපිට ඕකට අනුමැතිය දෙන්න බැහැනේ. ඕකේ පර්චස් ගාන අඩුවෙලාද වැඩි වෙලාද . ඒ වගේම ඕක රජයේ සර්වේ ප්ලෑන් එකක්ද, නැත්තම් පුද්ගලික සර්වේ ප්ලෑන් එකක්ද කියලා අපිට සවිස්තර වාර්තාවක් අවශ්‍යයි. නැත්තම් අපි අනුමැතිය දීලා මේකේ මොනවහරි ප්‍රශ්නයක් තිබ්බොත් අපි ඔක්කොමටනේ වග කියන්න වෙන්නේ.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
හරි මේක හරියටම පැහැදිලි කර ගන්න ඕන නිසා අපි මේ සභාව කාරක සභාවක් බවට පත් කරමු.

**<u>ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා</u>**
මේ ගරු සභාව කාරක සභාවක් බවට පත් කරමු කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා</u>**
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- ❖ ඒ අනුව පෙ.ව.11.00ට මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී. අනතුරුව විෂය නිළධාරි විසින් එම පිඹුරුපතට අදාළ ගොනුව කාරක සභාව වෙත ඉදිරිපත් කළ අතර, පිඹුරුපතට සැළසුම් කමිටුව මගින් අනුමැතිය ලබා දුන් ආකාරයත් , එම පිඹුරුපතට අදාළ සම්පූර්ණ විස්තරයත් සවිස්තරාත්මකව කාරක සභාව වෙත ඉදිරිපත් කරනලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
හරි මේ පිළිබඳව අපට පැහැදිලි කර අවබෝධයක් ලැබුණු නිසා අපි මේ කාරක සභාව දැන් මහා සභාව බවට පත් කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා</u>**
මේ කාරක සභාව මහා සභාව බවට පත් කරමු කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ❖ ඒ අනුව පෙ.ව. 11.15ට පමණ කාරක සභාව නැවතත් මහා සභාව බවට පත් කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
හරි අපි එහෙනම් මේ පිඹුරු පතට අදාළ පැහැදිලි විස්තරයක් අපිට ලැබුණා. ඒ අනුව බළන්ගොඩ, පෙට්ටිගල වත්ත, ජන උදා ගම්මානයේ එම්.එස්.දියගම මහතා සකස් කර ඇති පිඹුරුපත් අංක 3778 හි සඳහන් , ඉඩම් කොටස් 42ට පමණක් වලංගු වන පරිදි, මේ පර්චස් 07න් යුක්ත බිම් කොටස සඳහා පමණක් අනුමැතිය ලබා දෙමු.

- ➢ ඒ අනුව බළන්ගොඩ, පෙට්ටිගල වත්ත, ජන උදා ගම්මානයේ එම්.එස්.දියගම මහතා සකස් කර ඇති පිඹුරුපත් අංක 3778 හි සඳහන්, ඉඩම් කොටස් 42ට පමණක් වලංගු වන පරිදි, මේ පර්චස් 07න් යුක්ත බිම් කොටස සඳහා පමණක් අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### 06-08 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2025 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කර ගැනීම සම්බන්ධ යෝජනාව

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අපි මේ වර්ෂයේ 2025-12-31 දිනට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ඉදිරියේදී පටන් ගන්නවා. එතකොට මේ සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත් කරගන්න ඕනි. මේ සමීක්ෂණ මණ්ඩලය කාර්ය මණ්ඩලයේ නිළධාරීන් සහ අපේ සභිකවරුනුත් ඇතුළත් කරලා තමයි සකස් කරලා තියෙන්නේ. එතකොට මේ සමීක්ෂණය අපේ සභා කාර්යාලයේ සහ සභා කාර්යාලයට අදාළ උප කාර්යාලවල පවත්වනවා. 2026 ජනවාරි මාසේ 06 වෙනිදා ආරම්භ වෙලා ජනවාරි 30 වෙනකොට අවසන් කරන්න සැලසුම් කරලා තියෙනවා. ඒ වගේම මේ සමීක්ෂණ කටයුතු සඳහා අපිට පළාත් පාලන දෙපාර්තමේන්තුව මගිනුත් නිළධාරියෙක් සම්බන්ධ කරනවා. ඒ වගේම මම දැන් මෙන්න මේ සමීක්ෂණ මණ්ඩලය සහ පවත්වන දින මොනවද කියලා සභාවට ඉදිරිපත් කරන්නම්. සමීක්ෂණ මණ්ඩලයේ සභාපති විදියට අපේ නිළධාරිනියක් වන යූ.ජී.ඩී.කේ සිරිවර්ධන මහත්මියව කරනවා.

**2025 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය**

| අනු අංකය | සමීක්ෂණයට ලක් කරන ආයතන | සමීක්ෂණ මණ්ඩලයේ නිළධාරීන් | සමීක්ෂණ දිනයන් 2026 ජනවාරි |
|---|---|---|---|
| 1 | ප්‍රධාන කාර්යාලය සහ ගබඩාව | යූ.ජී.ඩී.කේ.සිරිවර්ධන මිය | 06/07/08/09 |
| | | ආර්.ආර්.එල්.ආරියරත්න මිය | |
| | | ඒ.එම්.සී.පී.අත්තනායක මයා | |
| | | ඩී.එම්.එච්.පී.රත්නායක මිය | |
| | | එම්.ජී.ඩී.එස්.ගුණදාස මයා | |
| | | එම්.බී.ගුණරත්න මැතිතුමා - ප්‍රාදේශීය සභා මන්ත්‍රී | |
| | | ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා - ප්‍රාදේශීය සභා මන්ත්‍රී | |
| 2 | කිරිමැටිතැන්න ආයුර්වේදය, පුස්තකාලය, පෙර පාසල | ඒ.එම්.ඩී.එච්.සී.අබේකෝන් මයා | 13/14/16 |
| | | යූ.ජී.ඩී.කේ.සිරිවර්ධන මිය | |
| | | ඩබ්.පී.ජී.එන්.ගුණරත්න මිය | |
| | | ඩබ්.යූ.ඩී.කේ.පියදාස මිය | |
| | | ඩබ්.ඩී.චන්ද්‍රිකා මිය | |
| | | එම්.පී.මල්ලිකාරත්න මැතිතුමා - ප්‍රාදේශීය සභා මන්ත්‍රී | |
| | | ඩී.බී.වී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය - ප්‍රාදේශීය සභා මන්ත්‍රී | |
| 3 | වේළිඔය, බුදුගල, දූවිලිඇල්ල,වැලිපත කසළ අංගනය, ආර්ථික මධ්‍යස්ථානය | යූ.ජී.ඩී.කේ.සිරිවර්ධන මිය | 22/23 |
| | | එල්.වයි.ඒ.එන්.රසාංජන මයා | |
| | | ජානකී මිය | |
| | | කේ.ඒ.ටී.ඩී,ධර්මරත්න මිය | |
| | | ජී.ජී.සී.එස්.වීරසිංහ මිය | |
| | | බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා -ප්‍රාදේශීය සභා මන්ත්‍රී | |
| | | ඩබ්.එම්.ඩබ්.ගීතානි වීරසේන මැතිනිය -ප්‍රාදේශීය සභා මන්ත්‍රී | |
| 4 | බුලත්ගම ආයුර්වේදය, පුස්තකාලය, මැද්දෙක්නද පෙර පාසල | යූ.ජී.ඩී.කේ.සිරිවර්ධන මිය | 27/28/29 |
| | | ජේ.එන්.පී.උදයංගනී මිය | |
| | | ජේ.ජී.එස්.මධුෂානි මිය | |

| | | | |
|---|---|---|---|
| | | ඩබ්.ටී.එම්.යූ.වන්නිආරච්චි මිය | |
| | | එස්.එච්.එච්.එල්.ජයසූරිය මිය | |
| | | රෝහණ ජගත් වීරසේකර මැතිතුමා -ප්‍රාදේශීය සභා මන්ත්‍රී | |
| | | ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා - ප්‍රාදේශීය සභා මන්ත්‍රී | |
| 5 | දාමහන ආදාහනාගාරය, රංදොළ පෙර පාසල, තොටුපලතැන්න කසළ අංගනය | එස්.එම්.එන්.ජේ.සමරසිරි මිය | 21/30 |
| | | සංජය වන්නිආරච්චි මයා | |
| | | බී.ටී.ඩී.ප්‍රනාන්දු මිය | |
| | | ආර්.නන්දසිරි මැතිතුමා -ප්‍රාදේශීය සභා මන්ත්‍රී | |
| | | පෙරුමාල් අසෝක්කුමාර් මැතිතුමා - ප්‍රාදේශීය සභා මන්ත්‍රී | |

- ඒ අනුව 2025-12-31 දිනට පවත්වනු ලබන භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා පත් කරනු ලැබූ සමීක්ෂණ මණ්ඩලයේ නිළධාරින්ට අදාළ දිනවලදී ඒ ඒ ආයතන වෙත ගොස් සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහාත් , සමීක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස යූ.ජී.ඩී.කේ.සිරිවර්ධන මියව පත් කිරීම සඳහාත් අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06-09 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන POS(POINT OF SALE) යන්ත්‍ර භාවිතා කිරීම සම්බන්ධ යෝජනාව

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

පළාත් පාලන ආයතනවල ආදායම් එකතු කිරීම, ගිණුම්කරණය සහ පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් නිර්මාණය කරලා හඳුන්වලා දීලා තියෙනවා local Government Payment Management System (LGPMS) කියලා මෘදුකාංග පද්ධතියක්. ඩිජිටල් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ අපේ ආයතනයටත් මෙන්න මේ කියන POS(POINT OF SALE) යන්ත්‍රය භාවිතා කරන්න අවස්ථාව හම්බ වෙලා තියෙනවා. ඒ වගේම කියන්න සතුටුයි පළාත් පාලන අමාත්‍යාංශයෙන් අපිට පරිගණකයකුත් හම්බ වුණා පරිත්‍යාග විදියට. එතකොට මේක අපේ කැෂියර් එකේ ලදුපත් නිකුත් කිරීමේ කටයුතු සඳහා තමයි භාවිතා කරන්නේ. ඒ තුළින් අපට පුළුවන් වෙනවා මහජනතාව එක්ක සිදු කරන ගණුදෙනුවල කාර්යක්ෂම බව වැඩි කර ගන්න. මොකද දැන් හැමදේම ඩිජිටල්කරණය වෙමින් තමයි පවතින්නේ. එතකොට අපිට මේ ලැබිලා තියෙන POS(POINT OF SALE) යන්ත්‍රය ලංකා බැංකුව හරහා තමයි අපි ලබා ගන්නේ. ඒ නිසා මේ POS(POINT OF SALE) යන්ත්‍රය භාවිතා කරන්න අප සභාවේ අනුමැතිය අවශ්‍ය වෙලා තියෙනවා.

- ඒ අනුව මහජනතාව සමග සිදු කරන ගණුදෙනුවල කාර්යක්ෂම බව වැඩි කිරීම සඳහා POS(POINT OF SALE) යන්ත්‍රය භාවිතා කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06-10 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන යුනයිටඩ් ක්‍රීඩා පිටියට ආවරණ දැලක් ඉදි කර ගැනීම සම්බන්ධ යෝජනාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.කුසුම්සිරි අලංකාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා</u>**
ගරු සභාපතිතුමාගෙන් අවසරයි, ඒ වගේම උප සභාපතිතුමාගෙන් අවසරයි, මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. මං නියෝජනය කරන එගොඩ වලේබොඩ කොට්ඨාශයේ වෙළේකුඹුර ග්‍රාම නිළධාරි වසමේ යුනයිටඩ් ලයන්ස් ක්‍රීඩා සමාජය තියෙනවා.ඒක ඉතාමත් වැදගත් ක්‍රීඩා සමාජයක් මේ වසමට . මොකද ඔවුන් ගමේ සංවර්ධන කටයුතුවලට පවා දායක වෙන යෞවන සමාජයක්. ඔවුන්ගේ ඉල්ලීමක් තිබ්බා ඔවුන්ගේ යුනයිටඩ් ක්‍රීඩා පිටියට ආවරණ දැලක් ඉදි කර ගැනීම සම්බන්ධව. ඉතින් ඔවුන්ගේ ක්‍රීඩා සමාජය තුළ ඉතා දක්ෂ වොලිබෝල් කණ්ඩායමක් ඉන්නවා. ඉතින් ඔවුන්ට පුහුණු වෙන්න සහ ඔවුන්ගේ කටයුතු කර ගෙන යන්න මේ වොලිබෝල් ක්‍රීඩා පිටිය ආවරණය කරලා දැලක් ඉදි කරලා දෙන්න කියලා කළ ඉල්ලීම තමයි මම මේ සභාවට යෝජනාවක් විදියට ගෙනාවේ. මේ සඳහා ඔබ සැමගේම සහයෝගය දෙන්න පුළුවන් නම් වටිනවා. මොකද අද කාලයේ තරුණ පරම්පරාව මත් උවදුරකට ලක්වෙලා තියෙන මොහොතක ඔවුන් යොමු වෙලා තියෙන්නේ ක්‍රීඩාවට. මේ විදියට තරුණයන් ක්‍රීඩාවට යොමු වෙනවනම් අපිට පුළුවන් ඔවුන් මත් උවදුරින් පවා ගලවා ගන්න. ඒ සඳහා මේ ගරු සභාවේ සහයෝගය ලබා දෙන්න කියලා මම ඉල්ලනවා.

- ඒ අනුව එගොඩ වලේබොඩ කොට්ඨාශයේ, වෙළේකුඹුර ග්‍රාම නිළධාරි වසමේ පවත්නා යුනයිටඩ් ක්‍රීඩා පිටිය වෙත දැල් ආවරණයක් ලබා දීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-11 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා විසින් ඉදිරිපත් කරන සභාව මගින් උත්පාදිත ආදායම් ප්‍රභවයන් යාවත්කාලීන කිරීම සම්බන්ධ යෝජනාව**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා මම මේ කාරණාව ඉදිරිපත් කරන්නේ පහුගිය පළාත් පාලන සතියට සමගාමීව පැවැත් වූ සමාරම්භක උත්සවය ඇල්ලවත්ත පන්සලේදී පැවැත්වුවා. එහිදි පැමිණ සිටි ආදායම් පරීක්ෂක නිළධාරින්ගේ ලිපි ගොනුව පරීක්ෂා කිරීමෙන් පසුව තමයි මම මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන්න ඕනි කියලා තීරණය කළේ. මොකද වර්තමානයේදී මම විශ්වාස කරනවා අපි සභාවක් විදියට එකතු කරලා තියන වරිපනම් බදු ප්‍රතිශතය පහළ අගයක තියෙන්නේ. මොකද 2023 අපේ අයවැය ඇස්තමේන්තුවේ ගත්තම දහඅට ලක්ෂ ගාණක් තමයි තියෙන්නේ. ඒ වගේම 2025 අනුමාන කරලා තියෙන්නේ ලක්ෂ 21ක්. මේ වෙනකොට ලක්ෂ 16ක් විතර ප්‍රතිපූර්ණය කරගෙන තියෙන්නේ. මේ වෙනකොට අපිට ලැබිලා තියෙන තොරතුරු අනුව 2025 වර්ෂයේ වැටුප් වලින් 25%ක් පමණ ප්‍රතිපූර්ණය කර ගන්න වෙලා තියෙන්නේ සභාවේ උත්පාදිත ආදායම්වලින්. ඒක 2026 දී 40%යි. 2028 විතර වෙනකොට සම්පූර්ණ මුදලම ප්‍රතිපූර්ණය කර ගන්න ඕනි. ඒ අනුව සභාවේ සියලුම සේවකයන්ට සභාවේ උත්පාදිත ආදායම්වලින් වැටුප් ප්‍රතිපූර්ණය කරන්න ක්‍රමයක් හදනවා කියලා කියනවා. ඒ වගේම මම විශ්වාස කරනවා සභාවේ වරිපනම් ප්‍රදේශ 11යි තියෙන්නේ. එතකොට ඒ 11ට විතරක් නෙවෙයි අපි කුණු එකතු කරනවා, වීථි ලාම්පු දානවා, සුභ සාධන කටයුතු කරනවා , ඒවටත් එක්ක තමයි අපි මේ වරිපනම් වලින් එකතු කරන මුදල් යොදවන්නේ. එතකොට දැන් වර්තමානයේ ලයිට් බිල වැඩිවුණා . අපි එතකොට ඒ වැඩිවුණ ගාණ ගෙවන්න ඕනි. එතකොට පුද්ගලික රෝහලකට ගියොත් ඔවුන් දැන් අය කරන මුදල අපි ගෙවන්න ඕනි. ඒ වගේ වැඩිවුණු සියළු දේවල් අපිට ගෙවන්න වෙලා තියෙනවා. නමුත් සේවා සපයන ආයතනයක් විදියට අපි 100ක් උපයලා 200ක් වියදම් කළොත් යම්කිසි කාලෙක මේ සභාවේ ආදායම නැතිවෙලා අපි කඩා වැටෙන තත්ත්වයට පත් වෙනවා. 2024 වර්ෂයේ කරපු සමීක්ෂණ වාර්තාවට අනුව, මම මේ වාර්තාව ඉදිරිපත් කරන්නම්. ලංකාවේ පළාත් පාලන ආයතන 341 න්, උත්පාදන ආදායම් වලින් සභාවල් කරගෙන යන්න ඒ කියන්නේ වැටුප් ගෙවන්න පුළුවන් කොළඹ මහ නගර සභාවටයි තවත් සභා 10 ට පමණයි. එතකොට මේකේ තියෙනවා සාමාන්‍ය තත්වයේ මහ නගර සභා 16 යි , නගර සභා 09යි, ප්‍රාදේශීය සභා 89යි. එතකොට ඕවා ඇවිල්ලා අපි කියන්නේ අයිසීයූ කියලා ඒ කියන්නේ අන්තිම අමාරු වෙච්ච්

මහ නගර සභා 05යි, නගර සභා 09යි, ප්‍රාදේශිය සභා 89යි. එතකොට අපේ එකද දන්නේ නැහැ මේ 89 වෙනියට තියෙන්නේ. එම නිසා මම යෝජනා කරනවා මේ පිළිබඳව විවෘත සාකච්ඡාවක් දාලා, අවශ්‍ය නම් කාරක සභාවක් හරි කරලා සාකච්ඡා කරලා අපිට මේ ප්‍රතිශතය වැඩි කර ගන්න පුළුවන්. අනික තමයි අර වාර්තා නිරීක්ෂණය කිරීමේදී සමහර වරිපනම් බදු මුල් මාසයේ ගෙවනවනම් මූලික වටිනාකමින් 10%ක කොමිස් එකක් ගෙවනවා. ආයිත් 5%ක් දෙනවා. කාර්තුවලට කඩලා තියෙනවා. එතකොට අපේ ඔය රාස්සගල සමහර ඒවා රුපියල් 60 වාරික වලින් ගෙවන්න තියෙනවා. එතකොට මෙහෙ ආදායම් පරීක්ෂක මහත්තයෙක් රුපියල් 60ක් ගන්න බයිසිකලේ හරි බස් එකේ හරි ගිහිල්ලා එයා ගෙදර හිටියෙ නැත්තම් නැවත එනවා. එතකොට නැවත පාරක් යන්න ඕනි. එතකොට මේ රුපියල් 60 ක් එකතු කරන්න රුපියල් 400ක් විතර වියදම් වෙලා. එතකොට එහෙම ආදායම් එකතු කරලා ඇත්තටම ප්‍රමාණවත් නැහැ. මොකද මේ ගරු සභාවම දැන ගන්න ඕනි අපි පුළුවන් තරම් ආදායම් ආධාර බලාපොරොත්තු වෙන්නේ නැතිව සභාව මගින් උත්පාදිත අදායමක් මගින් යම්කිසි රාජකාරියක් කරන්න. හැමදාම දූවිලිඇල්ලෙයි, ආදාහනාගාරයෙයි එල්ලිලා ඉන්නේ නැතිව වරිපනම් බදු ප්‍රතිශතය එහෙම වැඩි කරලා, මිනිස්සුන්ට අමාරුවක් නැතුව, වරිපනම් බදු එකතු කරන්න, වැඩි කරන්න පුළුවන් ක්‍රමයක් තියෙනවද කියල බලන්න ඕනි.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

මම අර කාරක සභා අවස්ථාවේත් කතා කළේ අපිට දැන් පළාත් පාලන ආයතන වල ප්‍රධාන ආදායම් ප්‍රභවයක් තමයි වරිපනම් බදු. හැබැයි දැන් අපිට ඒක වැඩි කර ගන්න , වර්ධනය කර ගන්න බැරි වෙලා තියෙන්නේ අපි ඒ අයට දෙන පහසුකම් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන නිසයි. අපිට සමහර තැන්වල කාණු ටිකවත් සුද්ධ කර ගන්න බැරි වෙලා තියෙනවා. ඊට අමතරව පාරවල් ටික සුද්ධ කරලා නෑ. ඒ වාගේම අපි ක්ෂේත්‍ර කම්කරුවන් විදියට බඳවා ගෙන තියෙන්නේ කාන්තාවන්. ඒ අය සමග මං කතා කළාට පස්සේ ඒගොල්ලෝ ඉදිරිපත් කරපු දේ තමයි සභාපතිතුමා, අපිට පාරේ වැඩ කරන්න නම් බෑ කියලා කිව්වා. ඉතින් එහෙම වෙන්න බෑ. අපි ඔක්කොම මැදිහත් වෙලා මේක හදන්න ඕනි. මේ වැඩ වල උස් පහත් බේදයක් නැහැ. වැඩවල තියෙන්නේ සමානකමක්. අපි මෙතන කිසි කෙනෙක් පහත් නැහැ. ව්‍යවස්ථාවෙන් මට බලයක් පවරලා තියෙනවා. හැබැයි අපි කවුරුත් සමානයි. ඒ මනෝභාවය ඒ ආකල්පමය වෙනස හදන්න ඕනි. ඒ වගේම තමයි අපි ඒගොල්ලන්ට පහසුකම් දෙන්න ඕනි. අපි ඒගොල්ලන්ගේ කසළ ටික එකතු කර ගන්න ඕනි, කාණු ටික සුද්ධ කරලා දෙන්න ඕනි, ඒ වෙනුවෙන් සභාවේ සේවය සපයන්න ඕනි. සභාව තියෙන්නේ ඒකට අපිට විවිධ නීතිරීති තියෙනවා. හැබැයි ඒවට මුවාවෙලා අපිට වැඩ නොකර ඉන්න බැහැ. උදාහරණයක් මම කියන්නම්, අපිට වතුර බවුසරෙන් වතුර බෙදන්න බැහැ .ඒක ආපදා කළමනාකරණ ඒකකයට තමයි අයිති. හැබැයි අපි දිගටම වතුර බෙදලා තියෙනවා. අපිට දැන් නවත්වන්න බැහැ ඒක. අවසානයේ ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියක් ගන්න සිද්ධ වුණා අපිට දැනට වතුර බෙදන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදාවන් සඳහා ගනු ලබන වතුර බවුසරේ අවුරුදු 4න් ස්ටාර්ට් කරලවත් නැහැ. මොකද ඒගොල්ලන්ගේ වැඩි අපි තමයි කරලා තියෙන්නේ. අපිට අදාළ නැති වැඩක්. නමුත් අපි ඒක මිනිස්සන්ට කියලා හරියන්නේ නැහැ. ඒක නිසා ගරු මන්ත්‍රීතුමා ඇත්තටම ඔබතුමාගේ යෝජනාව හොඳයි. ඒ ආදායම් වැඩි කර ගන්න, ඒ වරිපනම් වැඩි කර ගන්න අපි ඉස්සෙල්ලාම අර පහසුකම් ටික මිනිස්සුන්ට ලබා දෙන්න ඕනි. අංක 01 කසළ ටික විධිමත්ව එකතු කරන්න ඕනි. ඒ කියන්නේ දිරන කසළ. මොකද අපිට නොදිරන කසළ එකතු කරන්න දැනට තොටුපලතැන්න කසළ අංගනය තියෙනවා. ඒවා මලු ගණන් එකතු වෙනවා. ඒ වගේම අපිට මහා හිසරදයක් වෙච්ච පොළක් තියෙනවා. ඒ තමයි කිරිමැටිතැන්නේ පාරේ තියෙන පොළ. මම දැක්කා ගොඩක් හරිය රජයේ නිළධාරින්, උදේ පාන්දර ගිහිල්ලා තමයි ඒකේ බඩු මිලදී ගන්නේ. හවසට යන්නේ නැහැ. මොකද ඒ වෙනකොට දූවිලි වලින් පිරිලා මහ පාරේ බිම තියලා තමයි විකුණන්නේ. ඒ කියන්නේ මේ මිනිස්සු කන බොන ආහාර.දැන් **UD** එකේ සැළැස්මක් තියෙනවා කිරිමැටිතැන්න පොළ ඉන් එහාට අරන් යන්න. අතන අපේ කඩේ ගාවට. එතන සම්පූර්ණ පහසුකම් ටික හදනවා. කඩ කාමර ටික හදනවා. ඒ සියල්ලම හදලා ඉවර වෙලා එතනට අරන් යනවා. එහෙම බාධාවන් තියෙනවා. ඒනිසා අපි අර යෝජනාවට අවශ්‍ය කරන පසුබිම හදමු. එතකොට අපිට අපේ ආදායම් ප්‍රභවයන් වැඩි කර ගන්න පුළුවන්. අපි එහෙම කරමු. ඒ නිසා මේ සභාව කාරක සභාවක් බවට පත් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

- ඒ අනුව සභාවේ උත්පාදිත ආදායම් වැඩි කිරීමට අවශ්‍ය ක්‍රමවේද හඳුනාගෙන ඒවා යාවත්කාලීන කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**07. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
පහත සඳහන් කාරක සභා වාර්තා ගරු සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කරනවා.

7.1ටෙන්ඩර් කමිටු වාර්තාව - 2025-09-08 සහ 2025-09-26

- සභාව විසින් සළකා බලන ලදී.

7.2මුදල් කමිටු වාර්තාව 2025-09-26

- සභාව විසින් සළකා බලන ලදී.

**08. ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ , එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
2025 සැප්තැම්බර් මාසයට අදාළ ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශය සහ එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කරනවා.

- සභාව විසින් සළකා බලන ලදී.

**09.සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා ඇතුළු ගරු සභාවෙන් අවසරයි. බලන්ගොඩ ප්‍රාදේශීය සභාවට මාසික ආදායම් වැඩි කිරීම සම්බන්ධයෙන් වැදගත් වෙයි කියලා හිතෙන යෝජනා 02ක් තියෙනවා. පළවෙනි යෝජනාව තමයි අපි නොදිරන කසළ එකතු කරනවා. එතකොට එකතු වෙන ප්ලාස්ටික් උණු කරලා අපිට ප්ලාස්ටික් උපකරණ හදන්න පුළුවන්. ඒවා වෙළඳපොළට නිකුත් කරලා අපිට මාසෙට ලක්ෂ 100ක විතර ආදායමක් හොයන්න පුළුවන්.එතකොට සභාවට ආදායමක් නැහැ කියලා ප්‍රශ්නයක් නැති වෙනවා. අපිට මේවා උණු කරලා හදන හයිඩ්‍රොලික් මොල්ට් මැෂින් එකක් වෙන්නේ ලක්ෂ 38ක් වගේ මුදලක්. උදාහරණයක් විදියට ගත්තොත් අපි ඩස්ට්බින් එකක් හදනවනම් ඒ මෝල්ට් එක හදන්න යනවා ලක්ෂ 1.5ක් වගේ මුදලක්. ඒ දැනුම මා සතුව තියෙනවා. අපිට දැනුම ගන්නවනම් අපිට ආයතනයක් සම්බන්ධ කරගෙන ඒක කර ගන්න පුළුවන්. මම එතුමා එක්ක කතා කළා. කතා කළාට පස්සේ එතුමා කිව්වා ගරු සභාපතිතුමා සහ අදාළ නිළධාරින් සම්බන්ධ කරන්න කියලා. එතුමා දැනුම දෙන්නම් කියලා කිව්වා. ඔවුන් භාවිතා කරන ලද මැෂින් එකක් හරි අපිට දෙන්නම් කිව්වා අඩු මුදලකට. අනික තමයි ප්‍රාදේශීය සභාවට අයිති ඉඩම් තියෙනවා. අපේ ගමෙත් තියෙනවා. වසර 40 ක් විතර ඒ ඉඩම කැලෑ වැදිලා තියෙන්නේ. එතකොට මම දන්න විදියට ප්‍රාදේශීය සභාවට අයිති ඉඩම් මිනිස්සු බලෙන් අයිති කර ගෙන ගෙවල් හදා ගෙන ඉන්නවා. එතකොට ඒ වගේ සභාවට අයිති අත්හැර දමා තිබෙන ඉඩම්වල අපිට කුරුඳු වගාවක් වගේ දෙයක් කරන්න පුළුවන්. අවුරුද්දකට කන්න 02ක් වගේ කැපෙනවා. කැපෙනකොට සභාව මගින් ටෙන්ඩර් දාලා දෙන්න පුළුවන් ව්‍යාපාරිකයන්ට කපා ගෙන යන්න කියලා. එතකොට අදාළ ග්‍රාම සේවක නිළධාරිතුමා සහ සංවර්ධන නිළධාරිතුමිය සම්බන්ධ කරගෙන අපිට මේ කටයුත්ත කරන්න පුළුවන්. එතකොට සභාවට වසරකදී අවම කෝටි 10ක 15ක ආදායමක් ගන්න පුළුවන්. ඒක තමයි මගේ යෝජනා 02ක වෙන්නේ.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
අර ඔබතුමා කිව්වනේ සභාවට ඉඩම් තියෙනවා කියලා . ඔය ගොඩක් ඉඩම් සභාවේ වුණාට ඒවා ඉඩම් කට්ටි කරන අය ඒ කට්ටි කරන ලද ඉඩම්වල ඉන්න ජනතාවගේ පොදු අවශ්‍යතාවලට වෙන් කරපු

ඉඩම්. ඒතකොට ඒක පවරන්න කෙනෙක් නැති නිසා ඉඩම් අයිති බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට තමයි පවරන්නේ. දැන් උදාහරණයක් විදියට ගත්තොත් කිරිමැටිතැන්න තැඹිලි කැල්ල ඉඩම තියෙනවා අක්කරයකට පමණ ආසන්න ප්‍රමාණයක්. අපිට එතන නිවාස හදලා රෙන්ට් එකට දෙන්න පුළුවන්. නමුත් අර කොන්දේසිය නිසා අපිට ඒක කරන්න බැහැ. අපිට තියෙන්නේ නිකන් ඉඩමක් බලා ගන්නවා වගේ වැඩක්. අපේ කම්කරුවෝ දාලා වල් වැඳුණම සුද්ධ කරනවා විතරයි. අන්න අර පොදු අවශ්‍යතාවය කියන කොන්දේසියට අපි යටත් වෙලා තියෙනවා. මන්ත්‍රීතුමා අර කිව්ව ඉඩම අපි දන්නේ නැහැ අපේ සභාවට අයිති ඉඩමක්ද කියලා. අපි ඒ ගැන බලමු.මොකද ඒ යෝජනාව හොඳයි . අනික අර ප්ලාස්ටික් උණු කරලා අතුරු නිෂ්පාදන හදන එකේදී මගේ නම් පෞද්ගලික අදහස තියෙන්නේ අපිට පෞද්ගලික ව්‍යවසායකයෙක් සම්බන්ධ කර ගන්න පුළුවන් නම් අපිට අවශ්‍ය පහසුකම් ටික සපයලා සභාවකට බද්දක් ගන්න පුළුවන්. අපිට ජනාධිපතිතුමා හම්බ වුණ වෙලාවේදීත් කිව්වේ සභාවල් බිස්නස් කරන්න යන්න එපා කියලා. සභාව අවශ්‍ය දේවල් වලට පහසුකම් සපයනවා ඊට පස්සේ බද්දක් අය කරනවා. දැන් මේ සැරේත් පුනරාවර්තන වියදම්වලින් අපේ 20%ක් කපලා තියෙන්නේ. ලබන වසර වෙනකොට ඒක තවත් 20%න් වැඩි වෙනවා. මේ සැරේත් වැඩිපුර ලක්ෂ 18ක් ගෙව්වා අපි ඔබතුමන්ලාගේ සහ තුමියන්ලාගේ දීමනාවත් සමග. එහෙන් කැපුවට ඒක අපි මෙහෙන් දෙන්න ඕනි. ඒ නිසා අපි කොහොම හරි ආදායම් වැඩි කර ගන්න ඕනි.

**<u>ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා</u>**

සභාපතිතුමනි, මගෙත් අදහස් කීපයක් තියෙනවා ඉදිරිපත් කරන්න. එකක් තමයි දැන් සභාව ආදායම උපදවන තැනට ගේන්න එපැයි. දැන් සභාව පවත්වාගෙන යන්න අපි ලොකු මුදලක් උපයන්න ඕනි. එතකොට අපි දන්නවා දැන් බළන්ගොඩ ආසනය පුරාම තියෙනවා ඉඩම් අපේ මන්ත්‍රීතුමා කිව්වා වගේම. තැන්නෙත් තියෙනවා එහෙම ඉඩම්. අපි දන්නවා දැන් තැන්න කියන්නේ සංචාරක ආකර්ශණය දිනා ගත්තු ප්‍රදේශයක්. හුණුගල් පොකුණ තියෙනවා, දූවිලි ඇල්ල තියෙනවා, එතකොට කුරගල තියෙනවා. ඒ නිසා සංචාරක නිකේතනයක් වගේ දෙයකට අපිට යන්න පුළුවන් නම් හොඳයි කියලා. එතකොට අර ගල්ටැම්යාය ගාවක් ඉඩමක් තියෙනවා. මන් දන්නේ නැහැ ඒක සභාව සතුද කියලා. නමුත් අපි ඉදිරියේදී ඔය තියෙන ඉඩම් කඩම් ආදායම් උපදවන පැත්තට ලබන වර්ෂය සඳහා සකස්කරන සැලසුම්වලට ඇතුළත් කරමු කියලා මම යෝජනා කරනවා. එතකොට සභාවට ආදායම් උත්පාදනය කරන කොට මොන වගේ කාරණාවන්ටද මේවා යොදවන්නේ කියලා අපිට සැලැස්මක් තියෙන්න ඕනි. එතකොට ඔය සංචාරක පැත්තෙන් ගත්තහම තැන්න ආශ්‍රිතව ලොකු වටාපිටාවක් තියෙනවා. පිටින් එන අයට නවතින්න, අර මම කලින් කිව්ව ගල්ටැම්යායත් තියෙනවා සංචාරක නිකේතනයකට වගේ යනවනම්. ඒ වගේම ඉදිරියේදී පළාත් සභාවේ සහ මධ්‍යම ආණ්ඩුවේ සහයෝගය ලබා ගෙන සභාවට ආදායම් උත්පාදනය කළ හැකි ව්‍යාපෘති සකස් කරන එක තමයි කරන්න තියෙන්නේ. ඒක තමයි මගේ යෝජනාව වෙන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී.ඩී.ජයශිලි ලියනගේ මැතිනිය</u>**

ගරු සභාපතිතුමනි, කිරිමැටිතැන්න දැනට පවත්වා ගෙන යනු ලබන පොළ අපේ කඩේ ඉස්සරහට ගේන්න සූදානමක් තියෙන බව දැන ගන්න ලැබුණා. ඒ වගේම ඒ ආසන්නයේම සභාව සතු ඉඩමක් තියෙනවා රාජ්‍ය සේවා ගම්මානයේ. ඒ සඳහාත් අවධානය යොමු කරලා සුදුසු රැකියා උත්පාදනය කරන්න පුළුවන් ගොඩනැගිල්ලක් හරි ඉදි කරලා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මේ සභාව සතු ඉඩමේ විශාල මහෝගනී ගස් 02ක් තිබෙනවා. දැනට ඒ ගහේ අතු 02 ක් දිරලා සභාව සතු ඉඩම ආසන්නයේ ඉන්න පදිංචිකරුවෙකුට අවදානම් කියලා දැනුම් දුන්නා. ඒක ඉවත් කරලා දෙන්න කියලත් ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, මම කණගාටු වෙනවා, මොකද අපි මේ සභාවට වැඩක් කරන්න, සභාව යම් තැනකට ගන්න තමයි අපි මාසයක් තිස්සේ අදහස්, යෝජනා හොයාගෙන මේ සභාවට ඉදිරිපත් කරන්නේ. ඒවට අගයක් දෙන්න ඕනි. අර චින්තක මන්ත්‍රීතුමා යෝජනා කළේ ඉතාමත් හොඳ යෝජනා 02ක්. අර ප්ලාස්ටික් සම්බන්ධයෙන් ඉදිරිපත් කරපු යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක්. දැන් මේ අවස්ථාවේ ඒක ගැන කතා කරන්න බැහැ. මේක පුද්ගලික අදහස් දැක්වීමේ අවස්ථාව හින්දා. නමුත් මං විශ්වාස කරනවා මේ මන්ත්‍රීතුමන්ලාත් මොන මොනවා හරි දේවල් දන්නවා කියලා. එතකොට අපි මොනවා හරි යෝජනාවක් සභාවට ගෙනාපුවම ඒකට මොනවාහරි එකතු කරන්න කියලා. මොකද නැත්තම් එතුමාට ආයේ කවදාවත් ඔළුවට එන්නේ නැහැ අළුත් යෝජනාවක්. මොකද

යෝනාවක් දැන්මම ඒකට අගයක් වටිනාමක් එකතු වෙන්නේ නැත්තම් එතනදි හිතනවා මේ සභාවට යෝජනා දැම්මට වැඩක් නෑ. දාලා වැඩකුත් නැහැ කියලා. එතනට යන්න එපා කියලා මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. මොකද මම නම් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. සභාව එහෙම නැහැ. මම විපක්ෂයේ මන්ත්‍රී කෙනෙක් විදියට නෙවෙයි අපි 37 දෙනාම එක් කණ්ඩායමක් හැටියට හිතලයි කතා කරන්නේ. අපි එක හැඟීමෙන් මේක උස්සන්න ඕනි. මොකද වසරක් පාසා තියෙනවා වාර්ෂික ඇගයීම්. ඒ ඒ අවස්ථාවලදී මොන කාරණයකින් හෝ අපි එක්කෝ ආදායම් උත්පාදයෙන් හෝ නැත්තම්, සංචාරක කලාපයක් වැඩි දියුණු කරමින් හෝ අපිට පුළුවන් මේ සභාව ඉන්න තැනින් පළවෙනි තැනට අරගෙන එන්න. එතකොට මම මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලන්නේ කවුරු හරි යෝජනාවක් ගෙනාපුවහම ඒකට ඇගයීමක් දෙන්න. නැත්තම් අපිත් නිකන් අතහැරලා දානවා. අනික තමයි මාස 03ක් විතර යෝජනා කළා අපේ රාස්සගල ප්‍රදේශයේ වීථි ලාම්පු වගයක් දාන්න කියලා. හැබැයි සභාපතිතුමා මට බොහොම කණගාටුයි, රාස්සගල වරිපනම් ඒරියා එකේ තමයි ඔය වීථි ලාම්පු තියෙන්නේ. මෙතුමන්ලාත් ඕක හොඳටම දන්නවා, මොකද මම කීපවරක්ම ප්‍රකාශ කළා. ඇත්තටම ලැජ්ජයි දැන්. මම ඕනිනම් සභාවට සල්ලි දෙන්නම්, මගේ වැටුපෙන් අයින් කර ගන්න අයින් කරලා කවුරු හරි මහත්තයෙක් යවලා බල්බ් ටික දාන්න ලැස්ති කරලා දෙන්න. බොහොම කණගාටුයි. මෙතුමත් ඉන්නවා, මමත් ඉන්නවා, ඒවගේ දෙයක්වත් කරගන්න බැරි නම් වැඩක් නැහැ. මම දෙවෙනි පාරට සභාවේ නැගිටලා කියන්නේ.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

අපි රාස්සගල වීථි ලාම්පු සවි කරන්න ගියා. ඒ වගේම අපි පොදු තැනකට ආවා අලි ගැවසෙන පැති තියෙනවනේ. රජවක, මහවලතැන්න, ඉඹුලමුර, මුල්ගම, වගේ මෙන්න මේවට ප්‍රමුඛතාවය දෙන්න. මම ඔබතුමා ඉදිරිපත් කරපු දෙයට සාධාරණීකරණය වෙන්න නෙමෙයි මේ කතා කරන්නේ. ඊට පස්සේ අපි තීන්දුවක් ගත්තා ඔබතුමන්ලා දන්නවත් ඇති අපි දැන් වීථි ලාම්පු සවි කරන කොට කලින් තිබුණු ටිකට ප්‍රමුඛතාවය දෙනවා. ඒ අදහස තමයි අර නිළධාරින්ට යන්නේ. ඊට පස්සේ ඒගොල්ලෝ ප්‍රමුඛතාවය දෙන්නේ අර තියෙන වීථි ලාම්පු වලට බල්බ් සවි කරන්න. ඊට පස්සේ සම්පූර්ණ ගැලවිලා නම් ඒගොල්ලෝ මෙහෙන් බඩු අරන් ගිහිල්ලා හදන්න ඕනි. මේ සැරෙත් බල්බ් ගන්න හරිම අමාරු වුණා. ඒවා පහසුවෙන් මිලදී ගන්නත් බැහැනේ. ඔබතුමන්ලා දන්නවා ඒකට යන්න ඕනි ක්‍රමවේදය. ඔන්න ඔය කියන ගැටළු ටික තමයි අපිට බලපෑවේ වීථි ලාම්පු සවි කරනකොට.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනිය</u>**

ගරු සභාපතිතුමනි, අදහස් දැක්වීමක් විතරයි කරන්නේ යෝජනා ඉදිරිපත් කරන්න බැරි නිසා. වන අලි ප්‍රශ්නය ඉතාමත්ම දරුණු විදියට තැන්න, මොලමුර, රජවක, බෝවත්ත , දෙපැලමුල්ල කියන ප්‍රදේශ වලට ඉතාමත්ම තදින් බලපාලා තියෙනවා. මේ දවස් වල කුඹුරු විනාශ කරලා තියෙනවා, පොල් විනාශ කරලා තියෙනවා, ඒ විතරක් නෙවෙයි පොඩි දරුවන් සවස පාසල් ඇරිලා යනකොට , පන්ති ඇරිලා යනකොට ගොඩක් ගැටළු ඇති වෙලා තියෙනවා. පොඩි දරුවන්ට අලි මූණ ගැසිලා දැන් සවස පන්ති යන්නෙත් නැති තත්ත්වෙට පත් වෙලා තියෙනවා. ඒක නිසා ඔබතුමාගේ සුවිශේෂි අවධානය මේ සඳහා යොමු කරන්න කියලත්, ඒ සඳහා කිසියම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත් මම ඉල්ලා සිටිනවා ඒ වගේම වනජීවි නිළධාරින්ගෙන් නම් කිසිම සතුටුදායක ප්‍රතිචාරයක් නැහැ. ඔවුන් වාහනෙන් ඇවිල්ලා අඩුම තරමේ වාහනෙන් බහින්නෙවත් නැති තත්ත්වයට ඇවිල්ලා තියෙනවා. අඩුම තරමේ අලි වෙඩි දෙන්න තරම්වත් තත්ත්වයක් ඔවුන් ළඟ නැහැ. ඒක නිසා මේ සම්බන්ධයෙනුත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඒ වගේම අර මන්ත්‍රීතුමා කිව්ව ප්ලාස්ටික් ව්‍යාපෘතිය පාසල් මට්ටමින් දරුවන්ගේ දායකත්වය අරගෙන බොහොම ලස්සනට කරන්න පුළුවන්. ඒ වගේම අපිට ලංකාවටම ආදර්ශමත් ප්‍රාදේශීය සභාවක් විදියට මේ දෙය කරන්න පුළුවන්. ඒ වගේම අපි විපක්ෂය විදියට අවශ්‍ය ඕනිම මොහොතක සහයෝගය දෙන්න කැමතියි. ඒ වගේම ප්‍රාදේශීය සභාවේ ආදායම වැඩි කිරීම සම්බන්ධව මීට වඩා අපි උනන්දු විය යුතුයි කියලා මම විශ්වාස කරනවා. අර කිව්ව විදියට අපේ කඩේ ළඟ පොළ හදනවනම් එතනම අපිට පුළුවන් එළවළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ගොඩ නගන්න. මහා ලොකු වියදමක් නැතුව වුණත් අපිට එතන මධ්‍යස්ථානයක් විදියට මුලින්ම ස්ථාපිත කර ගන්න පුළුවන් වුණොත් අපේ ප්‍රදේශයේ ඉන්න ගොවි ජනතාවටත්, ලොකු සේවාවක් කර ගන්න පුළුවන් ඒ හරහා. ප්‍රාදේශීය සභාවට විශාල බදු මුදලක් එකතු කර ගැනීමේ හැකියාවත් තියෙනවා. ඒ සම්බන්ධයෙනුත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

ඇත්තම මේ හරිම ඛේදවාචකයක් අලි වෙඩි ගැන ගැටළුවකුත් තියෙනවා. ඒ වගේම අලි වැටක් ගහන වැඩකුත් තිබුණා. නමුත් එතනදි කොන්ත්‍රාත්කරුගේ පොඩි ප්‍රශ්නයක් තිබුණා. ඊට පස්සේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර සහෝදරයා වනජීවී එකේ ඉන්න ඉහළම නිළධාරීන් සමඟ වැලිගෙපොල සඳගනාගම පන්සලේ සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේදි ඔන්න ඔය කියන ගැටළුවත් ඒ අයට ආවා. ඒගොල්ලෝ වගේ වගක් නැතිව තමයි හිටියේ.අපේ දේශපාලන අධිකාරිය කොච්චර උනන්දු වුණත්, අපේ පැරණි රාජ්‍ය යාන්ත්‍රණයත් එක්ක වැඩ කරන්න හරිම අමාරුයි. ඒගොල්ලෝ ජනතාවට වග කියන්නේ නැහැ. මොකද ඒගොල්ලෝ ඒකට බැඳිලා නැහැ. දැන් අපේ ඊළඟ උත්සාහය මොකක්ද දේශපාලන අධිකාරිය ජනතාවට වගකියනවා වගේම නිළධාරීනුත් ජනතාවට වග කියන මට්ටමට පරිවර්තනය කරන්න ඕනි. ඒ නිසා අපි ඒගොල්ලොත් එක්ක කතා කරන්න ඕනි. අපි මුල්ගම පන්සලට ඔක්කොම එකතු වෙලා අපි අලි වැටක් හදන්න පටන් ගත්තා. දැන් අලි වැට ඉදි කිරීම් කරනවා. අපි ඒක කරන්නේ ශ්‍රම දායකත්වය සහිතව කරනවා. දැන් අපේ ජනතාව සම්බන්ධ වෙලා වළවල් ටික කපනවා, කණු ටික හිටවනවා, ඊට පස්සේ වැට වනජීවී එකෙන් ගහනවා. දැන් අපි ඒක ඉක්මන් කර ගෙන, අනිත් වසම්වලටත් කියලා ශ්‍රම දායකත්යෙන් කණු ටික ඉක්මනට හිටව ගත්තොත් විදුලි වැටට ඉක්මනින් කරන්ට් එක ගන්න පුළුවන්. අන්න ඒකට ඔබතුමන්ලාගේ සහ තුමියන්ලාගේ සහයෝගය අපේක්ෂා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මගේ යෝජනාවන් 02ක් තියෙනවා. එකක් හුණුගල් පොකුණ ආශ්‍රිතව තියෙනවා රජයේ ඉඩමක්. ඒක දැනට ප්‍රදේශවාසීන් විසින් අත්පත් කරගෙන තියෙනවා. ඒක සභාවට අරගෙන හුණුගල් පොකුණේ වාහන නවත්තලා ටිකට් කඩන්න පුළුවන් මට්ටමේ එකක් තියෙනවා. අනිත් එක තමයි දැනට අපේ බළන්ගොඩ ප්‍රාදේශීය සභාව සතු ත්‍රීවිල් රථගාල් රාශියක් තියෙනවා. ඒ එකක්වත් නියාමනය වෙලා නැහැ. මේක සභාව සතු කරගෙන සභාවට ආදායම් ගන්න පුළුවන් මාර්ගයක්. ඒ හැම ත්‍රී විල් රථගාලකම තියෙන්න පුළුවන් ත්‍රීවිල් රථ ප්‍රමාණය මෙච්චරයි කියලා නිශ්චිත කරලා සභාවේ රෙජිස්ටර් කළොත් සභාවට ආදායමක් ගන්න පුළුවන්. තව කාරණයක් තියෙනවා සභාපතිතුමනි, දැන් දිගින් දිගටම සභාවට ලියුම් දුන්නා. වීථි ලාම්පු හයි කරන්න තැන් ගොඩක් තියෙනවා. ඒ පිළිබඳව පොඩ්ඩක් අවධානය යොමු කරන්න. මොකද මිනිස්සු අපිට ලියුම් දෙනවා. අපි ඒවා සභාවට දෙනවා. අපි මහජන නියෝජිතයෝ හැටියට මෙතන ඇවිත් වාඩි වෙලා ඉන්නවා. මම දැන් දෙපොළක් සම්බන්ධව මෙහෙට ලියුම් දීලා තියෙනවා. එකක් පරණ වීථි ලාම්පු තිබුණු එකකට බල්බ් විතරයි මාරු කරන්න තියෙන්නේ. එකක් ඩොක්ටර් සංජීවලාගේ ගේ ගාව තියෙනවා. අනික ගලහිටිගම අතුරු මාර්ගයේ 04ක් තියෙනවා. ගලහිටිගම අතුරු මාර්ගය කියන්නේ අති විශාල ලෙස මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ගැවසෙන මාර්ගයක්. මේක ගමේ අයට හරිම හිසරදයක් වෙලා තියෙනවා. නිතරම කෝල් කර කර කියනවා ලයිට් ටික දාලා දුන්නේ නැහැ කියලා. දැනට මාස 04ක් වෙනවා තව කර ගන්න බැරි වුණා කියලා. අනිත් එක කිරිමැටිතැන්න ග්‍රාම සේවක කාර්යාලය. ඔය කියන හැම තැනකම මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ගැවසෙනවා. ඉතින් ඒ තැන්වල ප්‍රශ්න තියෙන නිසා තමයි ඉක්මනට හදලා දෙන්න කියන්නේ. ඉතින් ඒ පිළිබඳව සැළකිලිමත් වෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, සභාවේ මුදල් ප්‍රමාණය වැඩි කිරීම සම්බන්ධව අදහසක් ඉදිරිපත් කිරීමට පවතිනවා මටත්. ප්‍රාදේශීය සභාවට අයත්, අපේ කොට්ඨාශය ගත්තම වසම් 03ක් තියෙනවා. මම මේ කියන්නේ හොරකැටිය වසම ගැන. ඇල්ලෙපොල ඉස්කොලේට යටි පැත්තෙන් ඉඳලා පල්ලෙකන්ද ඉස්කෝලේ දක්වා කොළඹ බදුල්ල පාරේ තියෙන එකම ප්‍රදේශය හොරකැටිය ප්‍රදේශය. ඉතින් අපිට පුළුවන් එතන පේෂ කර්ම මධ්‍යස්ථානය තියෙන තැන රජයට අයිති ඉඩම් තියෙනවා. අපි එතන දැනට සංවර්ධන යෝජනාවලටත් දාලා තියෙනවා බහු කාර්ය ගොඩනැගිල්ලක් , හෙළ බොජුන්හලක් වගේ තැනක් හදන්න. මොකද ඒ හරිය හරි ලස්සන ප්‍රදේශයක්. ඉතින් වීව් පොයින්ට් එකක් වගේ එතන හදන්න පුළුවන්. ඉතින් ඒ හරියේ මේ වගේ ආදායම් ලබා ගන්න පුළුවන් තැනක් හදන්න පුළුවන් නම් වටිනවා.

වෙනත් අදහස් හා යෝජනා නොමැති බැවින් සභාව ප.ව.12.30 ට අවසන් කරන ලදී.

ගමඇතිගේ ආරියදාස
සභාපති
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව